## ඩී.එස්.එස්.මෙන්ඩිස් එ. වයඹ පළාත් සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/ 1472 /2019 (2019.11.26 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ  කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ  එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ඩී.එස්.එස්.මෙන්ඩිස්
**නොතිසි ලත් පාර්ශවය** -නම්කළ නිලධාරී,වයඹ පළාත් සමුපාකාර සංවර්ධන  දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**
මෙය ලේඛනගත කාර්යපටිපාටිය හරහා විභාග කරන ලදි.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.01.22 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.01.24 සහ 2019.01.29 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.02.09 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | **නැත** |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.04.20 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.01.22 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

I. අංක KL/02/02/වපකුලි/45/2018/27 දරන ආරවුල විභාග කිරීම සඳහා කුලියාපිටිය සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් බේරුම්කරුව පත් කළ ලිපියේ සහතික කළ පිටපතක්
II. අංක KL/02/02/වපකුලි/45/2018/27 දරන ආරවුල විභාග කිරීමේ කාලය දීර්ඝ කරමින් කුලියාපිටිය සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් බේරුම්කරුට නිකුත් කළ සියලුම ලිපිවල සහතික කළ  පිටපතක්

III. ආරවුල්වලට අදාළව නීතිපති දෙපාර්තමේන්තුවෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට එවන ලද බව කියන 1992.08.19 දිනැති 1/92 දරන ලිපියේ සහතික කළ පිටපතක්

IV. අංක 11/15/77/65 හා 1977.09.28 දිනැති චක්‍ර ලේඛයේ ඇතුළත් කර ඇති උප ලේඛන අනුමත කරමින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් සමුපකාර දෙපාර්තමේන්තුවට එවන ලද බව කියන ලිපියේ සහතික කළ පිටපතක්

V. අංක KL/02/02/වපකුලි/45/2018/27 ලෙස නම්කර ඇති මෙම ආරවුල බේරුම්කරණයට යොමු කරන ලෙසට පැමිණිලිකාර සී/ස අරුණලු ස.ණ.ස. සමිතිය විසින් කුලියාපිටිය සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්ගෙන් ඉල්ලුම් කළ ලිපියේ හෝ/සහ ඉල්ලුම් පත්‍රයේ සහතික කළ පිටපතක්

VI. සී/ස අරුණලු ස.ණ.ස. සමිතියේ වර්තමාන කාරක සභාවේ කාරක සභිකයන් සියලු දෙනාගේම නම්,තනතුරු ඔවුන් එම තනතුරට පත්වූ දිනය හා ඔවුන් එම තනතුරට පත් වූ ආකාරය

VII. සී/ස අරුණලු ස.ණ.ස. සමිතියේ වර්තමාන ලිපිනය හා පැරණි ලිපිනය වෙනස් වී තිබුනේ නම් එම ලිපිනය වෙනස් වූ දිනය

VIII. ආරවුල් විභාගයක වග උත්තරකරුවන් වෙනුවෙන් පෙනීසිටින නීති නියෝජිතයන්ගේ දුරකථන අක්‍රිය කළ යුතු බවත්, එම දුරකථන ආරවුල් විභාගය පවත්වන ශාලාවේ කෙළවරක තබා පැමිණිය යුතු බවටත් වයඹ සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් බේරුම්කරුවන්ට උපදෙස් ලබා දී තිබේද?

IX. ආරවුල් විභාගයක වග උත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටින නීති නියෝජිතයාගේ කමිසවල හා කලිසම්වල ඇති සාක්කු පරික්ෂා කිරීමට හා ඔවුන්ගේ ශරීරය ස්පර්ශ කිරීමට වයඹ පළාතේ බේරුම්කරුවන්ට නීතිමය බලයක් ලැබී තිබේද? තිබේ නම් ඒ කවර නීති මූලාශ්‍රයක් මගින්ද
වග උත්තරකරු වෙනුවෙන් පෙනී සිටින නීති නියෝජිතයාට බේරුම්කරුවෙකු විසින් තර්ජනය කිරීම නිත්‍යානුකූලද?

X. වග උත්තරකරුවෙකු හෝ ඔහුගේ නීති නියෝජිතයෙකු හෝ විසින් විරෝධතාවයක් /ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලූ විට , එම විරෝධතාවය/ප්‍රකාශය කිරීමට අවසර ලබා නොදී අවම වශයෙන් එසේ අවසර ඉල්ලූ බව හෝ කාර්ය සටහන්වලට /සාක්ෂි සටහන්වලට ඇතුළත් නොකර තර්ජනය කිරීමට වයඹ පළාතේ බේරුම්කරුවන්ට නීතිමය බලයක් තිබේද?

XI. පහත සඳහන් කර ඇති කටයුතු බේරුම්කරුවෙකු විසින් සිදු කිරීම නිත්‍යානුකූලද ? නඩුව දිනීමට අවශ්‍ය නම් තමන්ට අවශ්‍ය පුද්ගලයා පැමිණිල්ලේ නීති නියෝජිතයා ලෙසට පත් කළ යුතු බවට පැමිණිලිකාර සමුපකාර සමිතියේ කාරක සභාවෙන් බේරුම්කරුවෙකු ඉල්ලා සිටීම. ආරවුල් විභාගය පවත්වන ආරම්භක දිනයේදීම නිල නොවන ලෙසට වග උත්තරකාරියන්ගේ දුරකථන අංක ලබා ගෙන, ආරවුල් විභාගයෙන් බැහැරව කතා කරමින් ඔවුන්ට නීති නියෝජිතයන් සොයා දීමට

බේරුම්කරුවෙකු කටයුතු කිරීම. ආරවුල් විභාගයෙන් බැහැරව වග උත්තරකරියන් සමග කතා කරමින් ඔවුන්ට විවිධ උපදෙස් ලබා දීමට බේරුම්කරුවෙකු කටයුතු කිරීම.

XII. ආරවුල් විභාග කළ යුත්තේ ස්වභාවික යුක්ති රීතියට අනුකූලව බවට වයඹ පළාතේ බේරුම්කරුවන්ට වයඹ සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දී තිබේ නම්, ඊට අදාළ චක්‍ර ලේඛනයේ හෝ උපදෙස් ලිපියේ සහතික කළ පිටපතක්

XIII. වග උත්තරකරුවෙකුගේ නීති නියෝජිතවරයෙකුට විරුද්ධව මූලික විරෝධතාවයක් ඉදිරිපත් කිරීමට පැමිණිල්ලේ නීති නියෝජිතයෙකුට නීතිමය බලයක් තිබේද?

XIV. එවැනි නීතිමය බලයක් තිබේ නම් එසේ විරෝධතා ඉදිරිපත් කළ හැක්කේ කුමන කරුණු සම්බන්ධයෙන්ද? ඊට අදාළ නීති මූලාශ්‍ර මොනවාද?අර්ධ අධිකරණයක කාර්යන් ඉටු කරන යම් බේරුම්කරුවෙකු විසින් ආරවුල් විභාගයක් සඳහා කූඨ ලේඛන සකස් කර ඇති බව නිශ්චිත හා පැහැදිලි සාක්ෂි සහිතව ඔප්පු කළහොත් එවැනිබේරුම්කරුවකුගේ නම වයඹ පළාතේ බේරුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් ඉවත් කොට අසාධු ලේඛනයට ඇතුළත් කිරීමට වයඹ සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරනවාද? ඊට අමතරව කූඨ ලේඛන සකස් කිරීම සම්බන්ධයෙන් අදාළ බේරුම්කරුට විරුද්ධව ශ්‍රී ලංකා පොලිසියට පැමිණිලි කිරීමට වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරනවාද?

තොරතුරු නිලධරයා 2019.01.24 දිනැතිව ප්‍රතිචාර දක්වමින් සඳහන් කරන ලද්දේ සී/ස අරුනළු සණස සමිතියේ තැන්පත්කරුවන් විසින් අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීම මත සමිතිය සම්බන්ධව නඩු කිහිපයක් විභාග වෙමින් පවතින බැවින් ලිපියේ IX සිට XIV තොරතුරු ලබා දීමට පනතේ 5( ඊ) වගන්තියේ යටතේ හැකියාවක් නොමැති බවය. තවද තොරතුරු නිලධරයා 2019.01.29 දිනැතිව ප්‍රතිචාර දක්වමින් සඳහන් කරන ලද්දේ සී/ස අරුනළු සණස සමිතියේ තීරක විභාගය සම්බන්ධව විමසා ඇති අංක i-viii දක්වා වූ ලියකියවිලි ප්‍රධාන කාර්යාලයේ නොමැති අතර කුලියාපිටිය සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයේ හා අදාළ සමුපාකාර සමිතියේ ලියකියවිලි ඇති බැවින් අදාළ තීරක විභාගය පවත්වන තිරකවරයාගෙන් හෝ සහකාර කොමසාරිස් කොට්ඨාශයෙන් අදාළ ලියකියවිලි ලබා ගැනීමට කටයුතු කරන ලෙසය. ඒ අනුව අභියාචක 2019.02.09 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමුකරන ලද අතර නම්කළ නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් නොවීම මත අභියාචක 2019.04.20 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

මෙම අභියාචනය ලේඛනගත කාර්යපටිපාටිය හරහා විභාග කරන ලදි.

පොදු අධිකාරිය විසින් 2019.01.24 දිනැතිව අභියාචකට යොමු කර ඇති ලිපිය සම්බන්ධව කොමිෂන් සභාවේ අවධානය යොමුවිය. එකී ලිපිය මගින් පොදු අධිකාරිය විසින් දන්වා සිටින්නේ සී/ස අරුනළු සණස සමිතියේ තැන්පත්කරුවන් විසින් අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීම මත සමිතිය සම්බන්ධව නඩු කිහිපයක් විභාග වෙමින් පවතින බැවින් ලිපියේ IX සිට XIV තොරතුරු ලබා දීමට පනතේ 5(ඊ) වගන්තියේ යටතේ හැකියාවක් නොමැති බවය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5(ඊ) වගන්තිය ප්‍රකාරව පහත අවස්ථාවක් එළඹී විට තොරතුරු මුක්ත වේ..

*"ඔවුන්ගේ සේවා සැපයීමේදී නීතිපතිවරයා හෝ නීතිපතිවරයාට සහාය දක්වන යන නිලධාරයක් සහ පොදු අධිකාරීන් අතර පවතින යම් සන්නිවේදනයක් ඇතුළුව, යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ, වෘත්තිකයන් සහ එම වෘත්තිකයන් විසින් සේවා සපයනු ලබන යම් පොදු අධිකාරියක් අතර පවතින යම් සන්නිවේදන සංයුක්ත වන්නා වූ තොරතුරක් වන අවස්ථාවකදී."*

කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනුයේ අභියාචකගේ තොරතුරු ඉල්ලීමෙහි අයිතම IX සිට XIV තොරතුරු පනතේ 5(ඊ) වගන්තිය යටතට පැහැදිළි වශයෙන්ම අයත් නොවන බවය.

**නියෝගය:**

ඒ අනුව අභියාචකගේ 2019-01-22 දිනැති තොරතුරු ඉල්ලීමෙහි ඇතුලත් අයිතම අංක IX සිට XIV දක්වා සියලු තොරතුරු මෙම නියෝගය ලැබී සති දෙකක් (02) ඇතුළත කොමිෂන් සභාවට පිටපතක් සහිතව අභියාචක වෙත යොමු කරන ලෙසට පොදු අධිකාරියට මින් නියෝග කරනු ලැබේ. අංක I -VIII දක්වා තොරතුරු ඉල්ලීම් අදාළ පොදු අධිකාරිය වෙත යොමු කරන ලෙසද මෙයින් නියෝග කරනු ලැබේ.

ඒ අනුව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****